# රුහුණ විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාලවල, උසස් අධ්‍යාපන ආයතනවල **සේවයේ තහවුරු කර ඇති ස්ථිර සේවකයින්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් තමා සේවය කරන ආයතනයේ ලේකම්/ලේඛකාධිකාරී මගින් **2020 සැප්තැම්බර් මස 18 වන දින හෝ ඊට පෙර** ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් මෙම විශ්වවිද්‍යාලයේ **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන)** වෙත එවීමට සැලැස්විය යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් කර නොමැති හෝ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අනෙකුත් නියමිත අවශ්‍යතාවන් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ අයුරින් ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් ගැන නැවත සළකා බලනු නොලැබේ.

## 01. පූර්ණකාලීන උපශාලාධිපති (II ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

i. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතුය. නේවාසිකාගාර පරිපාලනය හා කළමනාකරණය පිළිබඳව පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** 42,885 - 18×660 - 54,765.00 [U MN 3(II) ] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 02. තාක්ෂණික නිලධාරී (II ශ්‍රේණිය) "අ" ඛණ්ඩය තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

i. (අ) තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම

හෝ

(ආ) ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(ඇ) අදාල විෂය හෝ ක්ෂේත්‍රය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(ඈ) අදාල විෂය හෝ ක්ෂේත්‍රය සම්බන්ධව පිළිගත් ආයතනයකින් ලබා ගන්නා ලද වසර 02 ක පූර්ණ කාලීන ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ වසර 01 පළපුරුද්දක් තිබීම.

**සටහන:** අදාල තනතුරේ ස්වභාවය අනුව කෘෂි විද්‍යාව / සත්ව පාලනය /ඉංජිනේරු විද්‍යාව/ තාක්ෂණය / වෛද්‍ය රසායනාගාර තාක්ෂණය ආදී විෂයන් විෂය ක්ෂේත්‍රයන් වශයෙන් සලකනු ලබන අතර එම ක්ෂේත්‍රයන්හි පිළිගැනීම පීඨය අවශ්‍යතාවය මත තීරණය කරනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** 35,145 - 7×355; 9×495 – 42,085.00 [UMT 1(II)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම :** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 03. තාක්ෂණික නිලධාරී (ICT) තනතුර

i. (අ) අපොස (උ/පෙල) පරීක්ෂණය විද්‍යා විෂය ධාරාව යටතේ එකවරකදී විෂයන් 3 සමත් වී තිබීම.විෂය සංකලනය / සංකලන අධ්‍යනාංශයේ නිර්දේශය මත අදාල විෂය විසින් තීරණය කරන පරිදි වේ.

සහ

(ආ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම විසින් අනුමත කරන ලද තාක්ෂණික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගත් හෝ පිළිගත් ආයතනයකින් ලබා ගත් තොරතුරු සන්නිවේදන සහ බහු මාධ්‍ය තාක්ෂණය පිළිබඳ හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව නිකුත් කරනු ලැබූ NVQ 5 මට්ටමට හෝ ඊට වැඩි මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

ii. වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු වේ.

**සටහන:** තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පළපුරුද්දක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** 31,625 - 7×300; 10×355 - 37,275.00 [UMT 1(IIIA)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්සභාව මඟින් නිර්දේශ කර ඇතිඅනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** ලිඛිත සහ / හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 04. පුහුණුවන තාක්ෂණික නිලධාරී (II ශ්‍රේණිය "ආ" ඛණ්ඩය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

i. (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් පහකට (05) කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) කින් සමත් වීම. සම්මාන සාමාර්ථය ලත් විෂයයන් අතරට විද්‍යාව සහ ගණිතය ඇතුළත් විය යුතුය.

හෝ

(ආ) තෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් විද්‍යාව සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් (06) කින් සමත්ව තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වසර අටක (08) ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

හෝ

(ඇ) උසස් අධ්‍යාපන ආයතනයක විද්‍යාගාර සේවකයෙකු වශයෙන් වසර පහළොවක (15) ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**සටහන:** බඳවාගනු ලබන තැනැත්තන් ප්‍රථමයෙන් වසර තුනක (03) ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව රු. 31,625/= ක ස්ථාවර මාසික වැටුපක් මත පුහුණුවන කාර්මික නිලධාරීන් වශයෙන් පත් කරනු ලැබේ. පුහුණුවීමේ කාලය අවසන් වීමෙන් පසු විද්‍යාගාර කටයුතු පිළිබඳ නිපුණත්වය, භාණ්ඩ ඇණවුම් කිරීම, තොග පොත් පවත්වාගෙන යාම සහ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීණතාවක් ලබාගත් සේවක භවතුන් තනතුරේ තහවුරු කර කාර්මික නිලධාරී (II ශ්‍රේණිය "ආ" ඛණ්ඩය) තනතුරට පත් කරනු ලැබේ.

සුදුසුකම් i (ආ) සහ (ඇ) යටතේ බඳවා ගැනීම ඇබෑර්තු සංඛ්‍යාවෙහි 25% ක් නොඉක්මවිය යුතුය.

**වැටුප් ක්‍රමය:** 31,625 - 7×300; 10×355 - 37,275.00 [U MT 1(IIIA) ] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** අභියෝගාතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 05. විනයාරක්ෂක (II ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

i. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු වීම.

ii. ශාරීරික සුදුසුකම්: පිරිමි - උස අඩි 5 අඟල් 5 ට නොඅඩු විය යුතුය.
- පපුව අඟල් 32 (සාමාන්‍ය) ක් විය යුතුය.

ගැහැණු - උස අඩි 5 අඟල් 4 ට නොඅඩු විය යුතුය.

iii. වයස අවුරුදු 30 ට වැඩි විය යුතුය.

**සටහන:** පොලිස් / සන්නද්ධ හමුදා සේවා පසුබිමක් ඇති සහ විශ්වවිද්‍යාල හා ජාතික මට්ටමේ ක්‍රීඩා කටයුතු හා සමාජ සුභසාධක කටයුතුවලදී ක්‍රියාකාරී ලෙස සහභාගි වී ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

හෝ

ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවේ මේජර් තනතුරට වඩා නොඅඩු තනතුරක සේවා පළපුරුද්ද ඇති හෝ ශ්‍රී ලංකා පොලිස්සියේ ඉහත තනතුරට සමාන හෝ ඊට නොඅඩු තනතුරක සේවා පළපුරුද්දක් තිබීම.

**වැටුප් ක්‍රමය:** 42,885 - 18×660 - 54,765.00 [U MN 3(II) ] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 06. විගණන සහකාර (II ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

1. අ.පො.ස. (සා.පෙළ) පරීක්ෂණය
   i. සිංහල/දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
   iii. ගණිතය

   යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරකදී සමත්ව තිබිය යුතුය.

සහ

2. අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණය එක් වරක දී සියලු විෂයයන් සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) (පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරක දී විෂයයන් තුනක් සමත් වී තිබීම ප්‍රමාණවත් වනු ඇත.)

සහ

3. (i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ප්‍රාථමික අදියර/විධායක අදියර/ආවසරික 1/පදනම් අදියර සමත් වී තිබීම.

හෝ

(ii) ශ්‍රී ලංකා වරලත් කළමනාකාරීත්ව ගණකාධිකරණ ආයතනයේ පදනම් අදියර සමත් වීම

හෝ

(iii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සමත් වී තිබීම.

හෝ

(iv) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සමාජිකත්වය ලබා තිබීම.

සහ

4. රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර 02 ක විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්ද

**සටහන:** අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ/රාජ්‍ය අංශයේ/පිළිගත් පෞද්ගලික සංවිධානයන්හි ගණකාධිකරණ/ විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඉහත (c) හි සඳහන් විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්ද වෙනුවෙන් සලකා බලනු ඇත.

**වැටුප් ක්‍රමය:** 37,275 - 18×495 - 46,185.00 [UMN 2(II)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම :** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 07. කළමනාකරණ සහකාර (සරප්) තනතුර

1. අ.පො.ස. (සා.පෙළ) පරීක්ෂණය

   i. සිංහල/දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
   iii. ගණිතය

   යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරකදී සමත්ව තිබිය යුතුය.

සහ

2. අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණය එක් වරක දී ගණකාධිකරණය ඇතුළුව සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

ඉහත දක්වා ඇති සුදුසුකම් වලට අමතරව පහත දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අය සඳහා ප්‍රමුඛතාවය හිමි වනු ඇත.

(අ) පිළිගත හැකි ආයතනයකින් ලබා ගන්නා ලද පරිගණක පිළිබඳ මාස හයක කාලයකට නොඅඩු පුහුණුව.

සහ

(ආ) පරිගණක මෘදුකාංග ක්‍රියාත්මක කිරීම පිළිබඳ වසර දෙකකට නොඅඩු කාලයක පළපුරුද්ද.

*සටහන:* යෝග්‍යතාව

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ආ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය

**වැටුප් ක්‍රමය:** 30,725.00 - 17×300 - 35,825.00 [UMN 1(IIIA) ] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 08. <u>කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) තනතුර</u>

1. අ.පො.ස. (සා.පෙළ) පරීක්ෂණය

   i. සිංහල/දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
   iii. ගණිතය

   යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරකදී සමත්ව තිබිය යුතුය.

සහ

2. අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණය එක් වරක දී සියලු විෂයයන් සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) (පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරක දී විෂයයන් තුනක් සමත් වී තිබීම ප්‍රමාණවත් වනු ඇත.)

සහ

3. ගබඩාකරණය පිළිබඳ වසරක පලපුරුද්ද තිබීම සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් වාණිජ්‍ය විෂය සමත්වීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ගණකාධිකරණය විෂය සමත්වීම.

ඉහත දක්වා ඇති සුදුසුකම් වලට අමතරව පහත දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අය සඳහා ප්‍රමුඛතාවය හිමි වනු ඇත.

(අ) පිළිගත හැකි ආයතනයකින් ලබා ගන්නා ලද පරිගණක පිළිබඳ මාස හයක කාලයකට නොඅඩු පුහුණුව.

සහ

(ආ) පරිගණක මෘදුකාංග ක්‍රියාත්මක කිරීම පිළිබඳ වසර දෙකකට නොඅඩු කාලයක පළපුරුද්ද.

*සටහන:* යෝග්‍යතාව

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ආ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

**වැටුප් ක්‍රමය:** 30,725.00 - 17×300 - 35,825.00 [UMN 1(IIIA) ] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 09. පුස්තකාල තොරතුරු සහකාර (III ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

1. අ.පො.ස. (සා.පෙළ) පරීක්ෂණය

   i. සිංහල/දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
   iii. ගණිතය

   යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරකදී සමත්ව තිබිය යුතුය.

සහ

2. අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණය එක් වරක දී සියලු විෂයයන් සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) (පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරක දී විෂයයන් තුනක් සමත් වී තිබීම ප්‍රමාණවත් වනු ඇත.)

3. පහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයක් මගින් ලබා ගත් පුස්තකාල හා තොරතුරු විද්‍යා විශයෙහි ශිෂ්‍යභාවය හෝ අර්ධ / පූර්ණ සුදුසුකම් ලබා තිබීම.

සහ

(ආ) පිළිගත් ආයතනයක් මගින් ලබා ගත් මාස හයකට නොඅඩු කාලඡේදයක් සහිත පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් ලබා තිබීම.

**වැටුප් ක්‍රමය:** 30,725.00 - 17×300 - 35,825.00 [UMN 1(IIIA) ] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 10. පරිපාලක - භූමිදර්ශක (II ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

1. (අ) (i) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත් වීම.

සහ

(ii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් හෝ ඊට සමාන ආයතනයක් විසින් පවත්වනු ලබන එක් අවුරුදු ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම.

(ආ) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සහ/හෝ උද්භිද උද්‍යානයක භූමිදර්ශන කටයුතු පිළිබඳ වසර 10 ක අත්දැකීම් ලබා ඇති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු සේවකයෙක් වීම.

**වැටුප් ක්‍රමය:** 31,625 - 7×300; 10×355 - 37,275.00 - මාසික [U-MT 1(IIIA)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 11. ආරක්ෂක සේවා පරීක්ෂක (II ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

(i) සම්මාන සාමාර්ථයන් පහක් (05) සහිතව විෂයයන් හයකින් (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම. සම්මාන ලත් විෂයයන්ට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුළත් විය යුතුය.

හෝ

(ii) තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් (06) කින් සමත් වී ඇති විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක ස්ථිර සේවයක් තිබෙන විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ සේවකයෙකු වීම. එසේ සමත් වූ විෂයයන්ට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුළත් විය යුතුය.

සහ

(iii) පොලිස් සේවයේ හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ආරක්ෂක සේවයේ හෝ වෙනත් පිළිගත් ආරක්ෂක සේවා ආයතනයක වසර පහකට (05) නොඅඩු සතුටුදායක සේවයක් තිබිය යුතුය.

(iv) ක්‍රීඩා කටයුතුවල ක්‍රියාශීලී සහභාගීත්වය තිබිය යුතුය.

(v) උස: අඩි 05 අඟල් 04 කට නොඅඩු විය යුතුය.
පපුව: අඟල් 34 කට නොඅඩු විය යුතුය. (සාමාන්‍ය)

**වැටුප් ක්‍රමය:** 30,725 - 17×300 - 35,825.00 [U-MN 1(IIIA)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 12. දුරකථන ක්‍රියාකරු/අමුත්තන් පිළිගැනීමේ නිලධාරී (II ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

i. දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් තුනකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය. එසේ සම්මාන ලත් විෂයයන්ට සිංහල, දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යය ඇතුළත් විය යුතුය.

හෝ

අටවන ශ්‍රේණිය සමත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වසර 10 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. එසේ සම්පූර්ණ කරන ලද සේවා කාලයෙන් එක් වසරක කාලය තුල දුරකථන යතුරු පුවරුව සම්බන්ධ කටයුතු වල නිරත වූ බවට පිළිගත හැකි තහවුරුවක් තිබිය යුතු වේ.

ii. ඉංග්‍රීසි භාෂාවෙන් කථා කිරීම පිළිබඳ මනා හැකියාවක් තිබිය යුතුය.

iii. දුරකථන යතුරු පුවරු ක්‍රියා කරවීම පිළිබඳව පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** 30,725.00 - 17×300 - 35,825.00 [UMN 1(IIIA) ] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය:** ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 13. ඖෂධවේදී (පහළ ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

(i) සුදුසුකම් ලත් ඖෂධවේදියකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම.

**වැටුප් ක්‍රමය:** 31,625 - 7×300; 10×355 - 37,275.00 - මාසික [U-MT 1(IIIA)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 14. පුස්තකාල සේවක (II ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

i. (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි සහ ශුද්ධ ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන් සමඟ දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් 06 කින් සමත් වීම.

හෝ

(ආ) අටවැන්න සමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක අවුරුදු 10 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ii. පුස්තකාල වැඩ කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් තිබීම.

**වැටුප් ක්‍රමය:** 27,025 - 15×250 - 30,775.00 [ U-PL 1(III) ] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** අභියෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 15. විද්‍යාගාර සහායක (පහළ ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

(i) අටවැනි ශ්‍රේණිය සමත් විය යුතුය.

**සටහන:** විද්‍යාගාර උපකරණ හා රසායනික ද්‍රව්‍ය පරිහරණය පිළිබඳ දැනුම ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** 28,025 - 16×270 - 32,345.00 [U PL 2(III)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** අභියෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 16. උපස්ථායක - සෞඛ්‍ය සේවා (පහළ ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

(i) 8 ශ්‍රේණිය සමත් වීම.

**සටහන:** රෝහලක හෝ වෛද්‍ය මධ්‍යස්ථානයක උපස්ථායකවරයෙකු ලෙස සේවය කර පළපුරුද්දක් ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** 28,025 - 16×270 - 32,345.00 - මාසික [U-PL 2(III)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** අභියෝගාතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 17. උපස්ථායක - පිරිමි/ගැහැණු (පහළ ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

(i) 8 ශ්‍රේණිය සමත් වීම.

**සටහන:** රෝහලක හෝ වෛද්‍ය මධ්‍යස්ථානයක උපස්ථායකවරයෙකු ලෙස සේවය කර පළපුරුද්දක් ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** 28,025 - 16×270 - 32,345.00 - මාසික [U-PL 2(III)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** අභියෝගාතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 18. ගෘහස්ත ක්‍රීඩාංගණ සහයක (පහළ ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

(i) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් සමත්විය යුතුය.
(ii) ගෘහස්ථ ක්‍රීඩාංගණ භාණ්ඩ හා ව්‍යායාම උපකරණ භාවිතය හා නඩත්තුව පිළිබඳ දැනුමක් තිබීම.
(iii) ගෘහස්ථ ක්‍රීඩාංගණ නඩත්තුව පිළිබඳ වසර දෙකකට නොඅඩු පළපුරුද්දක් තිබීම.
(iv) ගෘහස්ථ ක්‍රීඩා පිළිබඳ දැනුම. (අත්පන්දු,බැඩ්මින්ටන්,පැසිපන්දු හා මේස පන්දු ආදී)

**වැටුප් ක්‍රමය:** 28,025 - 16×270 - 32,345.00 [U-PL 2(III)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** අභියෝගතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 19. රියදුරු (II ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

i. අටවැනි ශ්‍රේණිය සමත් වී තිබිය යුතුයි.
ii. සැහැල්ලු සහ බර වාහන පැදවීමේ දක්ෂතාවය පිළිබඳ මෝටර් රථ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ප්‍රවීණතා සහතිකයක් තිබිය යුතුය.
iii. රිය පැදවීම පිළිබඳව අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.
iv. ධාවන අළුත්වැඩියාවන් කර ගැනීමේ හැකියාව තිබිය යුතුය.
v. අවම වශයෙන් උස අඩි 05 අඟල් 2 ½ ක් විය යුතුය.

vi. මහාමාර්ග නීති උපදේශක සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් ලබා තිබිය යුතුය.
vii. දිවා කාලයේ මෙන් ම රාත්‍රී කාලයේ ද සේවය කිරීම සඳහා මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත වීම සහ ඇස් පෙනීම හොඳ තත්ත්වයෙන් තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය:** 29,915 - 16×270 - 34,235.00[ U-PL 3(III) ] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම :** අභියෝගතා පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 20. <u>ජලනල කාර්මික (II ශ්‍රේණිය) තනතුර</u>

**අවශ්‍ය සුදුසුකම්:**

i. අටවැනි ශ්‍රේණිය සමත් වී තිබිය යුතුයි.

ii. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණතාවයක් ලබා සිටිය යුතුය.

(අ) අඟලෙන් 1/64 දක්වා පරිමාණයෙන් කියවීමට හැකියාව සහ ආයුධ නඩත්තු කිරීම හා ඒවායේ වත්මන් භාවිතය.
(ආ) නොයෙකුත් පිරිද්දුම් ඇතුළත්ව සී.අයි, ජී.අයි. සහ ඊයම් පයිප්ප දැමීම සහ ඒවා පරීක්ෂා කිරීම.
(ඇ) බෝල් වැල්වයන්, ජල භාජන ආදිය අළුත්වැඩියා කිරීම සහ සරල ඇඳීම් සටහන් කියවීමට හා තේරුම් ගැනීමට හැකියාව ආදිය පිළිබඳව දැනීම තිබිය යුතුය.

iii. ජලනල කර්මාන්තය පිළිබඳව වසර 02 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය:** 29,915 - 16×270 - 34,235.00 [ U-PL 3(III)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 21. <u>ට්‍රැක්ටර් ක්‍රියාකරු (II ශ්‍රේණිය) තනතුර</u>

**අවශ්‍ය සුදුසුකම්:**

i. අටවැනි ශ්‍රේණිය සමත් වී තිබිය යුතුයි.
ii. සියලුම බර වාහන පැදවීම පිළිබඳ මෝටර් රථ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ප්‍රවීණතා සහතිකයක් තිබිය යුතුය.
iii. රිය පැදවීම පිළිබඳව අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.
iv. ධාවන අළුත්වැඩියාවන් කර ගැනීමේ හැකියාව තිබිය යුතුය.
v. අවම වශයෙන් උස අඩි 05 අඟල් 2 ½ ක් විය යුතුය.
vi. මහාමාර්ග උපදේශක සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් ලබා තිබිය යුතුය.
vii. දිවා කාලයේ මෙන් ම රාත්‍රී කාලයේ ද සේවය කිරීම සඳහා මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත වීම සහ ඇස් පෙනීම හොඳ තත්ත්වයෙන් තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය:** 29,915 - 16×270 - 34,235.00 [U-PL3(III)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම :** අභියෝගතා පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 22. <u>තවාන් කරු (II ශ්‍රේණිය) තනතුර</u>

**අවශ්‍ය සුදුසුකම්:**

i. අටවැනි ශ්‍රේණිය සමත් වී තිබිය යුතුයි.

ii. දඬුකැබලි මුල් ඇද්දවීම, අතුබැඳීම, ආරුක්කු බද්දය, අංකුර බද්දය, රිකිලි බද්දය වැනි සියලුම ශාක ප්‍රචාරණ ක්‍රම පිළිබඳ සහ පැල බඳුන්ගත කිරීම තවාන් කළමනාකරණය සහ කප්පාදුව ආදී කටයුතු පිළිබඳ හසල දැනුමක් පැවතිය යුතුය.

iii. ගොවිපලේ හෝ උද්‍යානයේ වගාකර ඇති විවිධ ශාක විශේෂ හා බීජ වර්ග හඳුනා ගැනීමට හැකිවිය යුතුය.

iv. තවානෙන් භාහිරට ගෙන යන පැල විධිමත්ව ඇසිරීම පිළිබඳ දැනුමක් පැවතිය යුතුය.

v. තවාන් කරුවෙකු ලෙස අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් පැවතිය යුතුය.

**වැටුප් ක්‍රමය:** 28,025 - 16×270 - 32,345.00 [U-PL 2(III)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 23. <u>පෙදරේරු (II ශ්‍රේණිය) තනතුර</u>

**අවශ්‍ය සුදුසුකම් :**

i. 8 ශ්‍රේණිය සමත් වීම.

ii. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණතාවක් ලබා සිටිය යුතුය.

(අ) ගඩොල් බැඳීමේදී භාවිතා වන විවිධ ආකාරයේ බැමි රටා යොදාගෙන බිත්ති පාදම්, ආරුක්කු, කේතුමය කණු, දුම් කවුළු, කසල වලවල් ආදිය බැඳීමේ හැකියාව.

(ආ) විවිධ නිමාවලින් යුතු කපරාරු කිරීමේ හැකියාව, කම්බි යොදා කොන්ක්‍රීට් මිශ්‍රණය සාදාගෙන කොන්ක්‍රීට් දැමීමේ හැකියාව.

(ඇ) සාමාන්‍ය ඉදිකිරීම් සඳහා අඳිනු ලබන සැලැස්මට අනුකූලව අත්තිවාරම් සීමා සලකුණු කිරීමේ හැකියාව.

(ඈ) ඉමල්ෂන් තීන්ත ද ඇතුළුව තීන්ත ආලේප කිරීමේ හැකියාව.

iii. පෙදරේරුවෙකු ලෙස වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය:** 29,915 - 16×270 - 34,235.00[ U-PL 3(III) ] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 24. <u>භාරකරු /අරක්කැමි (පහළ ශ්‍රේණිය) තනතුර</u>

**අවශ්‍ය සුදුසුකම් :**

i. අ.පො.ස. (සා.පෙළ) පරීක්ෂණය දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් හතරක් සහිතව විෂයයන් හයකට නොඅඩු සංඛ්‍යාවක් සමග සමත්ව තිබිය යුතුය.

හෝ

තෘතීයික සහ අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලද තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයෙන් නිකුත් කරන ලද ඉවීම්/කාමර සේවක (NVQ මට්ටම් 03) ජාතික සහතිකයක් ලබා තිබීම.

ii. ගෘහ භාණ්ඩ, හැදිගැරුප්පු පිහි ආදිය හා ඇද ඇතිරිලි මනාව පාවිච්චි කිරීම හා අවට වටපිටාව හොඳින් නඩත්තු කිරීම සම්බන්ධ දැනුම තිබීම. බඩු වට්ටෝරු පොත් පවත්වාගෙන යාමට හැකියාව තිබීම.

iii. ලබා දෙන්නා වූ පුද්ගලයන් සංඛ්‍යාවකට පෙරදිග හා අපරදිග ඕනෑම ආහාර වේලක් ඉවීමේ හා පිළියෙල කිරීමේ හැකියාව තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය:** 28,025 - 16×270 - 32,345.00 [U-PL 2(III)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 25. <u>පශ්චාත් මරණ පරීක්ෂක කම්කරු (පහළ ශ්‍රේණිය) තනතුර</u>

**අවශ්‍ය සුදුසුකම් :**

i. 8 වන ශ්‍රේණිය සමත් විය යුතුය.

ii. මෘත ශරීර, මරණ පරීක්ෂණ සඳහා පිළියෙල කිරීමේ හැකියාව තිබිය යුතුය.
රිය සහායක කටයුතුවල යෙදී ඇති අය කෙරෙහි ප්‍රමුඛත්වය දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** 27,025 - 15×250 - 30,775.00 [ U-PL 1(III) ] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 26. <u>උද්‍යානකරු (II ශ්‍රේණිය) තනතුර</u>

**අවශ්‍ය සුදුසුකම්:**

(i) 8 ශ්‍රේණිය සමත් වීම.

(ii) ගෙවතු වගාව පිළිබඳ රාජකීය උද්භිත උද්‍යානය, පේරාදෙනිය උද්භිත උද්‍යානය, හග්ගල උද්භිත උද්‍යානය හෝ ගම්පහ උද්භිත උද්‍යානයෙන් ලබාගන්නා ලද වසර 02 කට නොඅඩු සේවා පළපුරුද්ද.

**වැටුප් ක්‍රමය:** 27,025 - 15×250 - 30,775.00 [ U-PL 1(III) ] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 27. රිය සහායක (III ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම් :**

i. 8 ශ්‍රේණිය සමත් වීම.

**සටහන:** රිය සහායක කටයුතුවල යෙදී ඇති අය කෙරෙහි ප්‍රමුඛත්වය දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** 27,025 - 15×250 - 30,775.00 - මාසික [U-PL I(III)] වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

ලේඛකාධිකාරී

රුහුණ විශ්වවිද්‍යාලය,
වැල්ලමඩම, මාතර.
2020.08.20